**ගම්පහ ප්‍රාදේශීය සභාව**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**-------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 16 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.1,888,580 ක් වූ ජංගම නොවන වත්කම් අඩුවෙන් පෙන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | සභා අරමුදලින් ඉදිකර තිබූ රු.647,767 ක් වූ ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වලට ඇතුලත් කළයුතු වේ. | 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | පොදු තැන්පත් ගිණුමේ ඇතුලත් නොවූ රු.262,170 ක මුදලක් තැන්පත්කරුවන් 44 දෙනෙකුට ආපසු ගෙවීමේදී පොදු තැන්පත් ගිණුමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.262,170 කින් අඩුවී තිබුණි. | නිවැරදිව ගිණුම්වලට ගැලපිය යුතු වේ. | ජර්නල් අංක 52 මගින් නිවැරදි කර ඇත |
| (iv) | වෙන්දේසි ඉඩම් 6 කට පොදු පහසුකම් සඳහා සභාවට ලබාදී ඇති අක්කර 01 රූඩ් 01 පර්චස් 29.29 ක් වූ ඉඩම් සහ ට්‍රැක්ටර් 05 ක් හා ටෙලර් 07 ක වටිනාකම තහවුරු කරගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරුකර වත්කම් ගිණුමට ඇතුලත් කළයුතු වේ. | 2019 වර්ෂයේ ගිණුමෙහි සටහන් කිරීමට කටයුතු කරමි. |
| (v) | ලැබිය යුතු ශේෂය තුළ වසර 1 ත් 3 ත් අතර රු.11,609,387 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.1,487,049 ක් සහ ගෙවිය යුතු ශේෂය | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමටත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමටත් පියවර | එම ශේෂයද ලේඛනවලින් සොයා බලා ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව |

| | | | |
|---|---|---|---|
| | තුළ වසර 1 ත් 3 ත් අතර රු.27,290,249 ක් පැවතුණි. | ගතයුතු වේ. | දන්වමි. |
| (vi) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ගිණුම් විෂයයන් 08 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.4,747,563 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ගිණුම හා උපලේඛණ අතර වෙනස්කම් ඉතා ඉක්මණින් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 **<u>අනුකූල නොවීම</u>**

**<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) | 9,012,220 | ඉකුත් තැන්පතු පිළිබඳව අර්ධ වාර්ෂිකව ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි නියමයන් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂය සඳහා අර්ධ වාර්ෂිකව ලැයිස්තු සකස් කර ඉදිරිපත් කරමි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.83,695,147 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,591,252 ක් විය

2.2 <u>මූල්‍ය පාලනය</u>.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා අරමුදල් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව වැය කිරීම සභාවේ අරමුණ වුවද රු.22,848,604 ක මුදලක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු 06 කද, රු.11,758,743 ක මුදලක් මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවකද ආයෝජනය කර තිබුණි. | පූර්ව සැලසුමකින් යුතුව ආයෝජනය කල යුතු වේ. | කල්පිරීමෙන් පසු ආපසු ලබාගෙන ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යොදවනු ඇත. |

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,539,500 | 18,600,577 | 17,198,554 | 36,354,071 | 18,543,690 | 18,399,205 | 19,627,496 | 35,364,629 |
| කුලී | 9,629,200 | 8,055,013 | 9,255,499 | 3,289,138 | 10,335,518 | 8,204,817 | 9,737,221 | 3,694,348 |
| බලපත්‍ර ගාස්තු | 1,351,000 | 770,490 | 1,267,717 | 1,000 | 1,284,475 | 525,550 | 1,031,573 | - |
| වෙනත් ආදායම් | 92,750,600 | - | 2,838,900 | - | 86,685,000 | - | 8,854,423 | - |
| | 122,270,300 | 27,426,079 | 30,560,670 | 39,644,209 | 116,848,683 | 27,129,572 | 39,250,713 | 39,058,977 |

2.3.2 **<u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේනිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් අයකර ගැනීමේ කාර්ය සාධනය සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 122 ක් වුවද බිල් කිරීම් රු.මිලියන 27 ක් හා ආදායම් රැස් | සැලසුම් කළ පරිදි ආදායම් රැස් කිරීම සිදුකළ යුතු වේ. | මෙම වර්ෂයේ සිට ආදායම රැස්කිරිමේ ප්‍රවනතාවය වැඩි කර ගැනීමට කටයුතු කරමි. |

කිරීම රු.මිලියන 19 ක් විය. වාර්ෂික ඇස්තමේන්තුව අනුව ආදායම් රැස්කිරීම සියයට 15.5 ක් පමණ විය.

2.3.3 <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | -------------------------------- |
| (අ) | ප්‍රවර්තන වර්ෂයේ බිල්කල වරිපනම් වටිනාකම රු.මිලියන 13.5 ක් වූ අතර රැස්කල ආදායම රු.මිලියන 6.6 කි. හිඟ වරිපනම් බදු රු. මිලියන 35.4 න් ප්‍රවර්තන වර්ෂයේදී රැස්කර තිබුණේ රු.මිලියන 5.9 කි. මේ අනුව හිඟ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 16 ක් පමණ පහල මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් අයකිරීම කාර්යක්ෂම කළ යුතු වේ. | ප්‍රගතිය විමසුමේ සඳහන් අගයට වඩා ඉහල අගයකට වර්ධනය කිරීමට කටයුතු කරමි. |
| **(ආ)** | හිඟ වරිපනම් පිළිබඳ සිදුකරන ලද කාල විශ්ලේෂණයට අනුව 2019 ජුනි 30 වන විට රු.36,565,032 ක හිඟ ශේෂයක් පැවතුණ අතර එම හිඟ ශේෂයේ අවු.5-10 අතර රු.7,391,481 ක් සහ අවු.10 ට වැඩි රු.16,828,820 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතු වේ. | 2019 ජුනි 30 දිනට කාල විශ්ලේෂණය අවු. 5-10 අතර හිඟ ශේෂය රු.7,391,481 අවු.10 ට වැඩි හිඟ ශේෂ රු.16,828,819 වේ. |

**2.3.4** <u>කඩ කුලී</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,559,182 ක කඩකුලී හිඟ ශේෂයක් පැවති අතර ඉන් වසර 5-10 අතර රු.517,592 ක් හා වසර 10 ට වැඩි රු.679,629 ක හිඟ ශේෂයක් විය. | අයවියයුතු හිඟ කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | වර්ෂ 10 ට වැඩි ශේෂයන්හි, අත්හැරීම සුදුසු බවට මහා සභාවෙන් තීරණයක් ගෙන ඇත. වැලිවේරිය කඩා ඉවත් කරන ලද කඩ කාමර 06 ට අදාල මූලික විමර්ශනයක් පවත්වමින් පවතී. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව කඩ හිමියන් දෙදෙනෙකුගෙන් 2002 ජනවාරි සිට 2007 අගෝස්තු දක්වා ලැබිය යුතුව තිබෙන රු.784,000 ක හිඟහිටි පෙර මුදල් ශේෂය 2018 ජුනි 10 දිනටත් අය කරගෙන නොතිබුණි. | දිගු කාලීන හිඟ පෙර මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ වන විට එම පරික්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. |

2.3.5 **වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | -------------- | ------------------------- |
| **දුරකථන සම්ප්‍රේෂණ කුළුණු** | | |
| (i) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ V වන උප ලේඛනයේ V වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයට අයත් දුරකථන කුළුණු සියල්ල හඳුනාගෙන ගාස්තු අයකරගෙන නොතිබුණි. | සියළුම සම්ප්‍රේෂණ කුළුණුවලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂයේ සිට අයකරගැනීමට කටයුතු කරමි. |
| (ii) සභාවට අයත් හෙනරත්ගොඩ උපකාර්යාලයේ දුරකථන කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ආදායම් උපයා ගැනීමට කටයුතුකර නොතිබුණි. | සමීක්ෂණය අනුව හඳුනාගත් පරිදි ආදායම් උපයා ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ වන විට හෙනරත්ගොඩ උප කාර්යාලයේ දුරකථන කුළුණු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ඇති අතර ඒ අනුව ආදායම උපයා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| **2.3.6 පරිසර බලපත්‍ර** | | |
| (අ) 2018 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර දී තිබුණු ආයතන 110 ක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී වෙළඳ බලපත්‍ර ලබා ගන්නා ආයතන වලින් පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියළු ආයතන සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) සභාව විසින් පරිසර බලපත්‍ර 92 ක් නිකුත්කර තිබූ අතර බලපත්‍ර 38 ක වලංගු කාලය ඉකුත්වී තිබුණි. | පරිසර බලපත්‍ර අළුත් කිරීමට පසු විපරම් සිදුකර බලපත්‍රලාභීන් දැනුවත් කලයුතු වේ. | වලංගු කාලය ඉක්මවා ඇති පරිසර බලපත්‍ර පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කරමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 15 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණු අතර අතුරු ව්‍යවස්ථා 15 ක් පනවාගෙන නොතිබුණි. | ඉටුකළයුතු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළයුතු වේ. | ඉතිරිව ඇති අතුරු ව්‍යවස්ථා වැළඳගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර තිබුණද පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් 15 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එම කර්තව්‍යයන්ද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

(ඇ) **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ප්‍රවර්තන වර්ෂයේ අයවැය මගින් රු.මිලියන 75.5 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ සැලසුම පමණක් පිළියෙලකර තිබුණි. | ඉටුකළ යුතු කාර්යයන් ප්‍රමාදයකින් තොරව සිදුකළයුතු වේ. | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් රු.10,000,000 ණය මුදලක් ඉල්ලුම් කර ඇති නමුත් 2018 ඔක්තෝබර් මස සිට රටේ පැවති දේශපාලන හේතු මත ණය කමිටුවට සහ කොමසාරිස් මණ්ඩල රැස්වීමට මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් නොකළ බව දේශීය ණය සංවර්ධන අරමුදලින් දන්වා එවා ඇත. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ----------------------------------- |
| (i) | සභාව දෛනිකව කසළ ටොන් 13-14 අතර ප්‍රමාණයක් එකතු කරන නමුත් දිරන කසළ මගින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කළයුතු වේ. | මේ සම්බන්ධව ඉදිරියේදී පුවත්පත් දැන්වීමක් පළ කර සුදුසු ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2008 ජූලි 30 දිනැති අංක 1560/06 , 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන හා 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ගැසට් පත්‍ර ප්‍රකාරව කසළ බදු හෝ ගාස්තු පනවා නොතිබුණි. | කසළ බදු හෝ ගාස්තු පැනවීමට කටයුතු කළයුතු වේ. | මෙම ගැසට් පත්‍ර ප්‍රකාරව කසල බදු හෝ ගාස්තු පැනවීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**(ඉ)** **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | -------------------------------- |
| ප්‍රවර්තන වර්ෂයේ අවසානය වන විට සභාව වෙත මහජන පැමිණිලි 197 ක් ලැබී තිබූ අතර ඉන් 62 ක් විසඳා තිබුණි. පැමිණිලි 89 ක් විසඳීම සඳහා ක්‍රියාත්මක වෙමින් සිටි අතර පැමිණිලි 46 ක් ස්ථානීය පරීක්ෂාව වෙත යොමුකර තිබුණි. | මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | විසඳා නොමැති මහජන පැමිණිලි ඉතා ඉක්මණින් විසඳීමට කටයුතු කරමි. |

(ඊ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | --------------------------------------- |
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂය | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගත යුතු වේ. | 2018 වර්ෂයේදී තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ අදාල සැලසුම් සකස් කරන ලෙස සභාව වෙත දන්වන ලද අතර ඒ අනුව තිරසර සංවර්ධන සැලැස්ම 2019 වර්ෂයේදි සකස් කරන ලදී. |

වෙනුවෙන් සකස්කර නොතිබුණි. 2019 – 2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්ම සකස්කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් සභා ගොඩනැගිල්ලේ ජල බිල් සඳහා රු.372,270 ක මුදලක් ගෙවා තිබූ අතර මේ තුල කුලියට දී තිබූ කඩ කාමර 36 ක ජල බිල්ද ඇතුලත්ව තිබුණි.ඒ අනුව කඩ කාමර සඳහා භාවිත වන ජලය වෙනුවෙන් අයකිරීමක් කිරීමට ක්‍රමවේදයක් සැකසීමට සභාව අපොහොසත්ව තිබුණි. | කඩ කාමර බදුකරුවන්ට වැයබරක් වන ක්‍රමවේදයක් සැකසිය යුතු වේ. | ජල සම්පාදන මණ්ඩලයෙන් ජල සැපයුම ලබා දී ඇති අතර මේ වන විට කඩ හිමියන් විසින් ජල බිල්පත් සඳහා ගෙවීම් කරනු ලබයි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ගලි බවුසර් සේවාව ලබා ගැනීම සඳහා 2018 වර්ෂයේදී සේවාලාභීන් 86 ක් ලියාපදිංචිව සිටි අතර ආසන්න ලෙස සතියකට දින 03 ක් සේවයේ යෙදුනේ නම් වසරකට දින 156 ක් සක්‍රියව සේවයේ යෙදිය හැකි බව නිරීක්ෂණය වුවද සභාව සේවය ලබා දීමට දින 18 සිට 51 දක්වා කාල ප්‍රමාදයක් සහිතව එම සේවය ලබාදී තිබුණි. | අත්‍යවශ්‍ය හා ඉතා කඩිනමින් සිදුකළයුතු මෙම සේවාව සභාව විසින් කාර්යක්ෂමව සිදු කළයුතු වේ. | ගලිබවුසරය ක්‍රියා විරහිත වීම හේතුවෙන් එය අළුත්වැඩියා කර යථා තත්ත්වයට පත්කරගැනීම දක්වා වූ කාලය තුල ගලි බවුසර් සේවාව ලබාදීමට නොහැකි වී ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙන්දේසි ඉඩම්වලින් පොදු පහසුකම් සඳහා වෙන් කරන ලද අක්කර 01 රූඩ් 01 පර්චස් 29.29 ක ඉඩම් කට්ටි 06 ක් ලේඛනගතකර නොතිබුණි. | සභාව සතු සියලු වත්කම් ලේඛනගත කළයුතු වේ. | ඔප්පු අංක 2468 ලේඛනගතකර ඇති අතර ඔප්පු අංක 5144 සහ 336 හැර අනෙකුත් ඉඩම් කැබලි 03 සඳහා සභාව සතුව ඔප්පු නොමැති බැවින් ලේඛනගතකර නොමැති බවත් ඒ සඳහා ප්‍රකාශන ඔප්පු සකස්කර ඉදිරි කටයුතු කිරීමට අවධානය යොමුකර ඇති බවත් දන්වා සිටිමි. |

3.4.2 **<u>වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබානොගැනීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැලිවේරිය පොදු වෙළඳපල බිම් මහලේ කඩ කාමර 04 ක් හා ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කඩ කාමර 04 ක් වසර 05 කට අධික කාලයක සිට අපේක්ෂිත ප්‍රතිලාභ රහිතව තිබුණි. | සභාව සතු වත්කම් ආර්ථිකමය හා ඵලදායිව යෙදවිය යුතු වේ. | වැලිවේරිය පොදු වෙළඳපොල ටෙන්ඩර් නොගිය කඩ කාමර තෙවන වරටත් ප්‍රාදේශිය වශයෙන් ලංසු කැඳවා ඇත. |

3.4.3 **<u>පවරා නොගත් වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පලාත් පාලන අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද එකතු වටිනාකම රු.45,717,101 ක් වූ වාහන 05 ක්ද, මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් ලද වටිනාකම හඳුනා නොගත් වාහන 06 ක් හා ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ලබාදුන් එකතු වටිනාකම රු.2,750,000 ක් වූ වාහන 02 ක්ද ඇතුළුව වාහන 13 ක් 2019 ජූනි 10 දින වන විටත් පවරාගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉහත වාහන පවරා ගැනීම සඳහා එම ආයතන වෙත ලිඛිතව දන්වා යවා ඇත. |

3.4.4 **<u>වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගලහිටියාව මහජන පුස්තකාලයේ රු.66,933 ක් වටිනා පොත් 460 ක් හා හෙනරත්ගොඩ මහජන පුස්තකාලයේ රු.2,050 ක් වටිනා පොත් 58 ක් අස්ථානගතවී තිබුණු බව භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය විය. | වගකිවයුතු නිලධාරින්ගෙන් අය කරගත යුතු වේ. | පොත් නිශ්චිත වශයෙන්ම අස්ථාන ගතවී ඇතිද යන්න, පසු විපරම් කිරීමෙන් හෝ සිදු කිරිමට කටයුතු කරමි. |

3.5 <u>ආර්ථික නොවූ ගණුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------- | ------------- | ------------------ |
| ප්‍රවර්තන වර්ෂයේ රු.500,250 ක වියදමක් දරමින් කතුරුවත්ත පෙර මිශ්‍රණ අංගනයට ආරක්ෂිත කැමරා පද්ධතියක් සවිකර තිබූ අතර එහි අරමුණ ලෙස අධීක්ෂණය පහසු කිරීම හා පරිපාලනය විධිමත් කිරීම වුවද මෙම පද්ධතියේ ස්වයංක්‍රීයව දත්ත ගබඩා කිරීමේ කාලය සතියක් පමණ වන බැවින් අත්‍යවශ්‍ය දර්ශන නිරීක්ෂණය කර ගබඩා කර ගැනීමට ක්‍රමවේදයක් නොතිබූ බැවින් ඉහත අරමුණු ඉටුකරගත් බවට නිරීක්ෂණය නොවුණි | වියදම් දැරීමේදී ආර්ථිකමය හා ඵලදායිව යෙදවිය යුතු වේ. | මෙම ස්ථානය සඳහා දුරකථන පහසුකම් ඉල්ලුම් කර ඇති අතර එය ලැබුණු පසු කැමරා පද්ධතිය ජංගම දුරකථනය මගින් වූ නිරීක්ෂණය කිරීම සඳහා පහසුකම් සලසා ගැනීමට සැලසුම් කර ඇත. විශාල වටිනාකමක් ඇති වාහන හා යන්ත්‍ර සූත්‍ර මෙම අංගනයේ ස්ථානගත කර ඇති බැවින් සිදු වීමට ඉඩකඩ ඇති අලාභහානි වලක්වාලීම සඳහා ආරක්ෂක සේවය යොදවා ඇති බව දන්වා සිටිමි. |

3.6 <u>අවිධිමත් ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------- | ------------- | ----------------- |
| වටිනාකම රු.2,278,484 ක් වූ තැන්පතු ශේෂ 116 ක් සහා අනුමැතියකින් තොරව ගිණුමෙන් කපාහැර ආදායමට එකතුකර තිබුණි. | අධිකාර බලයකින් යුතුව කපාහැරිම් කළයුතු වේ. | පසුව අනාවරණය කරගත් උපලේඛන සහිත රු. 2,278,484 මුදල නැවත ජර්නල් අංක 55 මගින් තැන්පත් ගිණුමට ගෙන ඇත. |

3.7 **<u>ප්‍රසම්පාදනය</u>**

3.7.1 **<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------------ | ---------------------------------- |
| ප්‍රවර්තන වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත්කර තිබූ රු.4,539,000 ක මිලදී ගැනීම් වර්ෂය තුල සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුගතව මිලදී ගැනිම් කළයුතු වේ. | අත් කරත්ත 2 ක් 2019 වර්ෂයේදී සභාවට මිලදී ගැනිමට සැලසුම් කර ඇති අතර ආයුර්වේද බෙහෙත් සහ<br>ගබඩා ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර ඇත. |

3.7.2 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | ---------------------------------- |
| 2018 වර්ෂයේ සභාවට ව්‍යාපෘති 497 ක් අනුමතවී තිබූ අතර ඉන් 2019 ජූනි 10 වන විටත් ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 116 ක් ආරම්භ කර නොතිබුණි | අවශ්‍ය අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති නිම කිරීම කළයුතු වේ. | ගම්පෙරලිය වේගවත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති 216 ක් 2018 ඔක්තෝබර් 19 වන විට ලැබී ඇත. මේ වන තෙක් ආරම්භ කිරිමට අනුමැතිය ලැබී නොමැති බැවින් එම ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වී ඇත. |